*අ.පො.ස (උ. පෙල)*

# 33 - ගිණුම්කරණය

නව නිර්දේශය

දැනුමෙන් සන්නද්ධ වූ අනාගත පරපුරක් බිහි කරනු වස් **QuestionBank.Lk** හා **ACCA (Sri Lanka)** ආයතන එක්ව සිදුකරන සමාජ සත්කාරයකි.මෙම සගරාවේ ***E - කලාපය*** පහත වෙබ් පිටුව තුලින් භාගත (Download) කල හැක.

**www.Questionbank.lk/CSR**

මෙම පෙරහුරු ප්‍රශ්න පත්‍රය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ගණකාධිකරණ අංශයේ ආදි සිසුන් කණ්ඩායමක් සහ වරලත් ගණකාධිකාරීවරුන් දෙදෙනෙකු එක්ව නිර්මාණය කර ඇත.මෙය පුනරීක්ෂණ ප්‍රශ්න පත්‍රයක් වන අතර ඉලක්ක ගත හෝ අනුමාන ප්‍රශ්න පත්‍රයක් නොවේ.

අ.පො.ස (උ. පෙළ)

# 33 - ගිණුම්කරණය

## නව නිර්දේශය

# QUESTION BANK

YOUR E - LEARNING PARTNER




**ප්‍රකාශනය හා අයිතිය**

Questionbank.lk (Pvt) Ltd
No - 11
මයුර මාවත
බෙල්ලන්විල
බොරැලැස්ගමුව
T.P – 077 3125364
Email – questionbank.lk@gmail.com

**අධීක්ෂණ සභාය**

ධනුෂ්ක මදුරංග
*ACA, BSc. Accounting (Sp) J'pura*
නාමල් දයාරත්න
*BSc. Administration (Sp) J'pura*
දිමුතු මධුසංක
*CBA, BSc. Accounting (Sp) J'pura*
අෂාන් චන්දිමාල්
*BSc. Accounting (Sp) J'pura*
ලහිරු බණ්ඩාර
*BSc. Finance (Sp) J'pura*

**නිර්මාණකරණය**

ගයාන් රුකාන්ත
*Dip in Graphic Design*


## පෙරවදන

ශ්‍රී ලංකා විභාග දෙපාර්මේන්තුව (2019) දී නිකුත් කල මූලාකෘති ප්‍රශ්න පත්‍ර ආකෘතිය සහ (2020) අ.පො.ස උසස් පෙල විභාග ප්‍රශ්න පත්‍ර ආකෘතිය අනුව මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත.වරලත් ගණකාධිකාරිවරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කිරීම තුලින් ඉහල ගුණාත්මක තත්වයක් ආරක්ෂා කිරීමට අප බලාපොරොත්තු වුනෙමු.ඉතා ඉහල ගුණාත්වයකින් යුත් ඉගෙනුම් ආධාරක දැයේ දූ දරුවන්ට නොමිලයේ ලබා දීම තුලින් සියලුම දූ දරුවන්ට අධ්‍යාපනයට ඇති සම අයිතිය තහවුරු කිරීමටත්, අධ්‍යාපනයට ඇති සාම්ප්‍රදායික බාධා ඉවත් කිරීමට සහ ගුරුවරුන්ට බාධාවකින් තොරව සිය ඉගැන්වීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය සහාය ලබා දීම මෙම ව්‍යාපෘතිය තුලින් බලාපොරොත්තු වේ.

මෙම සගරාව සෑම මසකම 15 වන දින පාසල් ගිණුම්කරණය විශය භාර ආචාර්යවරයාට තැපැල් මගින් ලැබීමට සලස්වන අතර පාසල් දරුවන්ට සහ උපකාරක පන්ති ගුරුවරුන්ට මෙහි මෘදු පිටපත (Softcopy) පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසීම තුලින් නොමිලේ භාගත (Download) කල හැක.

**www.questionbank.lk/CSR**

විශය ගැටලුවක් නිරාකරණය කරගැනීමට හෝ මෙම සගරාවේ පවතින සංකීර්ණ විශය කරුණක් නිරාකරණය කරගැනීමට පහත දැක්වෙන Whatsapp අංකයට හෝ Facebook පිටුවට කෙටි පණිවිඩයක් යොමු කරන්න.
Facebook – QuestionBank.lk
WhatsApp – 077 3125674

සියලු ම හිමිකම් ඇවිරිණි/அனைத்து உரிமைகளும்/All Right Reserved

WWW.QUESTIONBANK.LK

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

**ගිණුම්කරණය** | 33 S I | **පැය දෙකයි**

**උපදෙස්:**

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ.
* විභාග අංකය ඉහලන් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
* වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණන යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

විභාග අංකය :..........................................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 1 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

---

**1.** පහත දැක්වෙන කුමන ප්‍රකාශය මූලා ගිණුම්කරණයේ වැදගත්කම වඩාත් හොඳින් විස්තර කරන්නේ ද?

1) තීරණ ගැනීමට කළමනාකරුවන්ට අවශ්‍ය මූල්‍ය තොරතුරු සැපයීමයි.
2) ව්‍යාපාරයේ වත්කම් භාවිත කල ආකාරය පිලිබඳව කළමණාකරුවන්ට අවශ්‍ය තොරතුරු සැපයීම.
3) ව්‍යාපාරයක් පිළිබඳ ඇල්මක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ගනුදෙනු හා සිද්ධීන් පාදක වූ ආර්ථික තොරතුරු සපයයි.
4) ව්‍යාපාරයක ඉපැයීම් ශක්තිය හා මූල්‍ය තත්වය පිළිබඳ ව්‍යාපාර අභ්‍යන්තර පාර්ශව දැනුවත් කිරීම.
5) ගිණුම්කරණ ඒකකයට අදාළ සියලුම තොරතුරු ඇල්මැති පාර්ශවයන්ට සැපයීමයි

**2.** SB තොග වෙළඳසැලේ ආරම්භක තොගයේ වටිනාකම රු. 20,000 කි. වර්ෂ අවසානයේ බැංකුවේ තැන්පත් කර ඇති මුදලට විකුණුම් රු. 60,000 කි. සෑම මසකම රු. 2,000 බැගින් විකුණුම් වලින් ලද මුදලින් ඒවා බැංකු ගත කිරීමට පෙර වෙළඳ ව්‍යාපාරයේ වරිපනම් හා කඩ කුලී ගෙවා ඇත. වර්ෂය තුළ ශුද්ධ ගැනුම් රු. 48,000 ක් වූ අතර රු. 4,000 ක තොග ආපසු යවා ඇත. ලාභ ආන්තිකය පිරිවැය මත 33 1/3% කි.

වර්ෂය තුළ ඉපැයූ දළ ලාභය හා වර්ෂ අවසාන තොගය වන්නේ (පිළිවෙලින්),

1) රු. 21,000 / රු. 5,000    2) රු. 21,000 / රු. 1,000    3) රු. 5,000 / රු. 21,000
4) රු. 28,000 / රු. 12,000    5) රු. 1,000 / රු. 21,000

**3.** 2023 දෙසැම්බර් මාසයේ වෙළඳ ව්‍යාපාරයක පහත ගණුදෙනු සිදු වී ඇත.

- ණයපත් (Credit cards) මගින් විකුණුම් රු. 700,000
- අත්පිට විකුණුම් රු. 500,000 (මුදල් ව්‍යාපාරයේ කවුන්ටරය වෙත මුදල් ලැබුණි.)
- ණයට විකුණුම් රු. 300,000 (මුදල් ව්‍යාපාරයේ කවුන්ටරය වෙත මුදල් ලැබුණි.)
- ලැබිය යුතු ගිණුම් වල ආරම්භක ශේෂයන් රු. 120,000
- ලැබිය යුතු ගිණුම් වල අවසාන ශේෂයන් රු. 100,000

සියළුම මුදල් ලැබීම් ඔවුන්ගේ බැංකු ගිණුමේ තැන්පත් කිරීම ව්‍යාපාරික ප්‍රතිපත්තියයි. 2023 දෙසැම්බර් බැංකුගත කළ මුදල වන්නේ,

1) රු. 820,000   2) රු. 680,000   3) රු 1,520,000
4) රු. 320,000   5) රු. 500,000

**4.** 2023.04.01 දින අනුර තම ව්‍යාපාරයේ කටයුතු සඳහා ඔහු සතු රු. 3,500,000 ක ලොරි රථය යොදවන ලදී. එදින රු. 800,000 ක තොග ණයට විකුණූ අතර රු. 60,000 ක භාණ්ඩ ඇණවුමට අනුකූල නොවූ නිසා හරවා එවා ඇත. මෙම ගණුදෙනු සටහන් කිරීමට භාවිතා කරන මූලාශ්‍ර ලියවිලි අනුපිළිවෙලින්,

1) විකුණුම් ඉන්වොයිසිය, බැරපත, ලදුපත
2) ලදුපත, ජ'නල් වවුචරය, ගැණුම් ඉන්වොයිසිය
3) ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, හරපත
4) ජ'නල් වවුචරය, විකුණුම් ඉන්වොයිසිය, බැරපත
5) ලදුපත, විකුණුම් ඉන්වොයිසිය, බැරපත

**5.** සමීර විසින් තම පෞද්ගලික මුදලින් රු. 60,000 ක් ගෙවා ව්‍යාපාරයේ බැංකු අයිරාව පියවා දමන ලදී. මෙම ගනුදෙනුවෙහි බලපෑම ගිණුම්කරණ සමීකරණයෙහි පෙන්වන්නේ,

1) රු. 60,000 කින් වත්කම් වැඩිවීම සහ 60,000 කින් වගකීම් වැඩිවීම ලෙසය
2) රු. 60,000 කින් හිමිකම් වැඩිවීම සහ 60,000 කින් වත්කම් වැඩිවීම ලෙසය
3) රු. 60,000 කින් හිමිකම් වැඩිවීම සහ 60,000 කින් වගකීම් අඩුවීම ලෙසය
4) රු. 60,000 කින් හිමිකම් වැඩිවීම සහ 60,000 කින් ආදායම් අඩුවීම ලෙසය
5) රු. 60,000 කින් වත්කම් අඩුවීම සහ 60,000 කින් හිමිකම් අඩුවීම ලෙසය

**6.** පහත තොරතුරු තොග වෙළෙඳසැලක 2023.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාල වේ.

| | **රු. 000** |
|---|---|
| ආරම්භක තොගය | 4,800 |
| අවසාන තොගය | 3,100 |
| හානිවූ තොගය | 1,600 |
| ගැණුම් | 59,500 |

මෙම තොරතුරු පදනම්කරගත් දළ ලාභය රු. 6,720,000 කි. මෙම ගණනයේදී අවසාන තොගය 112,000 කින් අධි ගණනය වී ඇති අතර ආරම්භක තොගය 256,000 කින් අවතක්සේරු වී ඇත. 2023.03.31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ නිවැරදි දළ ලාභය වන්නේ,

1) රු. 6,352,000   2) රු. 6,576,000   3) රු 7,088,000
4) රු. 6,208,000   5) රු. 6,325,000

**7.** සමාගමක 2023 මාර්තු මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| **දිනය** | **විස්තරය** | **ඒකක** | **ඒකක පිරිවැය** |
|---|---|---|---|
| 2023.03.01 | තොගය | 3,000 | 10 |
| 2023.03.05 | ගැනුම් | 1,000 | 12 |
| 2023.03.15 | ගැනුම් | 2,000 | 15 |
| 2023.03.16 | ආපසු යැවුම් (2023.03.15 මිලදීගත් භාණ්ඩ වලින්) | 200 | ? |

2023 මාර්තු මාසය තුළ භාණ්ඩ ඒකක 3,500 ක් විකුණා ඇති අතර සමාගම තොග නිකුත් කිරීම මිල කිරීමේදී පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමය භාවිතා කරයි.

2023.03.31 දිනට තොගයේ වටිනාකම කීයද?

1) රු. 27,000 කි　　2) රු. 30,000 කි　　3) රු. 33,000 කි
4) රු. 36,000 කි　　5) රු. 38,000 කි

**පහත දී ඇති තොරතුරු ඇසුරෙන් පහත ප්‍රශ්න ද්විත්වය සඳහා පිළිතුරු සපයන්න.**

| | රු. |
|---|---|
| ණයගැතියන්ගේ අඩුවීම | 60,000 |
| ණයහිමියන්ගේ වැඩිවීම | 40,000 |
| තොගය අඩුවීම | 15,000 |

2022/2023 වර්ෂයේ ණයහිමියන්ගෙන් රු. 10,000 ක වට්ටමක් ලද අතර ණයගැතියන්ට දුන් වට්ටම් රු. 15,000 කි. ආපසු එවුම් රු. 5,000 ක් වන විට ආපසු යැවුම් රු. 8,000 ක් විය. මුදලට ගැණුම් රු. 110,000 කි. ණයට ගැනුම් රු. 120,000 කි. අත්පිට විකුණුම් රු. 150,000 කි. ණයට විකුණුම් රු. 190,000 කි.

**8.** 2022/2023 වර්ෂයේ ණයගැති ලැබීම් ප්‍රමාණය වන්නේ,

1) රු. 210,000　　2) රු. 180,000　　3) රු 260 ,000
4) රු. 230,000　　5) ඉහත කිසිවක් නොවේ

**9.** 2022/2023 වර්ෂයේ ව්‍යාපාරයේ දළ ලාභ අනුපාතය වන්නේ, (ආසන්න වශයෙන්)

1) රු. පිරිවැය මත 10%　　2) රු. පිරිවැය මත 29%　　3) රු විකුණුම් මත 20%
4) රු. විකුණුම් මත 29%　　5) ඉහත කිසිවක් නොවේ

**10.** සීමිත අශෝක පොදු සමාගමේ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කරන ලද මුළු විස්තීර්ණ ආදායම රු. 600,000 ක් විය. නමුත් එය ගණනය කිරීමේදී පහත වැරදි සිදු වී ඇති බව පසුව අනාවරණය විය.

- අවසාන තොගය ගණනය කිරීමේ දී පිරිවැය රු. 20,000 ක් වූ තොගයක් මඟහැරී තිබුණි.
- රු. 40,000 ක පොලී ආදායම, පොලී වියදමක් ලෙස සටහන් කර ඇත.
- ප්‍රථම වර ඉඩම් ප්‍රත්‍යාගණනයේදී හටගත් රු. 100,000 ක ප්‍රත්‍යාගණන අලාභය සටහන් කර නොමැත.
- පෙර වර්ෂයේ කපාහළ රු. 30,000 ක බොල්ණය නැවත ලැබීම ණයගැති පාලන ගිණුමට බැර කර මුදල් ගිණුමට හර කර ඇත.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසු නිවැරදි මුළු විස්තීර්ණ ආදායම වන්නේ,

1) රු. 600,000 කි　　2) රු. 610,000 කි　　3) රු. 620,000 කි
4) රු. 630,000 කි　　5) රු. 640,000 කි

**11.** ආයතනයක 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය තොග | 2023.04.01 දිනට | 25,000 |
| | 2024.03.31 දිනට | 20,000 |
| අමුද්‍රව්‍ය මිලට ගැනීම්. | | 80,000 |
| පරිවර්ථන පිරිවැය. | | 120,000 |
| ඍජු ශ්‍රම පිරිවැය | | 30,000 |
| පොදු කාර්ය පිරිවැය | | 90,000 |
| 2023.04.01 සිට 2024.03.31 දක්වා නොනිමි තොගයේ වැඩිවීම | | 30,000 |

2024.03.31 න් අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

1) රු. 205,000　　2) රු. 175,000　　3) රු 200,000
4) රු. 235,000　　5) රු. 240,000

**12.** 2024 මාර්තු 31 දිනට දයාරත්නගේ මුදල් පොතේ බැංකු ශේෂය සහ බැංකු ප්‍රකාශනයේ ශේෂය යන දෙකෙහිම එකම අගයක් පැවතුණි. කෙසේ වෙතත් ගනුදෙනුකරුවෙක් එදිනට පෙර සෘජුවම බැංකුවේ තැන්පත් කරන ලද රු.1,200ක් මුදල් පොතේ සටහන් කර තිබුණේ නැත.2024 මාර්තු 31 දින මුදල් පොතේ බැංකු ශේෂය සහ බැංකු ප්‍රකාශයේ ශේෂය එක හා සමාන වීමට හේතුව පහත දැක්වෙන දෑ අතුරින් කුමක් විය හැකිද ?

1) මුදල් පොතේ සටහන් නොවූ ණයගැති ප්‍රේෂණ රු. 1,200
2) ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු. 2,400
3) තැන්පත් කළ එහෙත් උපලබ්ධි නොවූ චෙක්පත්වල එකතුව රු.1,200
4) ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්වල වටිනාකම රු. 2,200 ක් වීම
5) ඉහත සඳහන් කිසිදු හේතුවක් අදාල නොවේ

**පහත ප්‍රශ්න ද්විත්වය සඳහා පිළිතුරු සැපයීමට මෙම තොරතුරු භාවිතා කරන්න.**

රුපියල් මිලියන 200 ක ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිතව 2022.04.01 දින ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද සමාගමක් 2023/24 සහ 2022/23 යන වර්ෂ සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

| විස්තරය | 2023/24 (රු. මිලියන) | 2022/23 (රු. මිලියන) |
|---|---|---|
| මුළු ආදායම | 300 | 200 |
| මුළු වියදම (ආදායම් බදු හැර) | 180 | 240 |
| ආදායම් බදු | 40 | - |
| ගෙවූ ලාභාංශ | 20 | - |
| ප්‍රත්‍යාගණන සංචිත (මාර්තු 31 දිනට) | 30 | - |
| මුළු වත්කම් (මාර්තු 31 දිනට) | 300 | 210 |

**13.** 2023.03.31 දිනට මුළු වගකීම් කොපමණද ?

1) රු. මිලියන 10
2) රු. මිලියන 30
3) රු. මිලියන 40
4) රු. මිලියන 50
5) රු. රු. මිලියන 120

**14.** 2024.03.31 දිනට හිමිකම කොපමණද ?

1) රු. මිලියන 170
2) රු. මිලියන 190
3) රු. මිලියන 250
4) රු. මිලියන 230
5) රු. රු. මිලියන 240

**15.** වෙළඳ ව්‍යාපාරයක් විසින් කල්බදු පදනම මත ලබාගත් වත්කම් දෙකක් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| ගොඩනැගිල්ල | කල්බදු කාලය වර්ෂ 20 කි. ගොඩනැගිල්ලේ ප්‍රයොජනවත් ජීවිත කාලය වසර 45 කි. |
| මෝටර් වාහනය | කල්බදු කාලය වර්ෂ 1 කි. එහි ජීව කාලය වර්ෂ 5 යි. |

මෙම ගොඩනැගිල්ල සහ මෝටර් වාහනය SLFRS 16 ප්‍රමිතයට අදාල වේද අදාල නොවේද යන්න දක්වන්න.

| | **ගොඩනැගිල්ල** | **මෝටර් වාහනය** |
|---|---|---|
| 1) | අදාල වේ | අදාල නොවේ |
| 2) | අදාල වේ | අදාල වේ |
| 3) | අදාල නොවේ | අදාල නොවේ |
| 4) | අදාල නොවේ | අදාල වේ |
| 5) | අදාල වේ | අවිනිශ්චිතය |

**16.** සමාගමක් 2024.03.01 දින නව යන්ත්‍රයක් ආනයනය කළ අතර ඊට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| යන්ත්‍රයේ මිල | 600,000 |
| ආපසු නොගෙවන ආදායම් බදු | 100,000 |

| | |
|---|---|
| ප්‍රවාහන පිරිවැය | 200,000 |
| වරාය ගාස්තු | 50,000 |
| වාර්ෂික නඩත්තු පිරිවැය | 120,000 |

- යන්ත්‍රය සවිකිරීමේදී එය සවි කළ සේවකයාගේ වැරදීමකින් එහි කොටසක් විනාශ වූ අතර එය යථා තත්වයට පත් කිරීමට රු. 40,000 ක් දැරීමට සිදුවිය.

LKAS –16 (දේපළ, පිරියත හා උපකරණ) ට අනුව 2024.03.31 දිනට මෙම යන්ත්‍රයේ පිරිවැය කීයද?

1) රු. 950,000
2) රු. 970,000
3) රු. 990,000
4) රු. 1,000,000
5) රු. 1,100,000

**17.** තොග අයිතම තුනක් සඳහා 2024.03.31 දිනට පහත සඳහන් තොරතුරු සමාගමක් විසින් සපයා ඇත.

| අයිතම | නිෂ්පාදන පිරිවැය | අපේක්ෂිත විකුණුම් ආදායම (රු) | අපේක්ෂිත විකුණුම් වියදම (රු) |
|---|---|---|---|
| A | 13,000 | 15,000 | 5,000 |
| B | 10,000 | 16,000 | 4,000 |
| C | 17,000 | 19,000 | 7,000 |

අයිතම ක්‍රමය අනුව 2024.03.31 දිනට තොගයේ වටිනාකම කුමක්ද?

1) රු. 32,000
2) රු. 34,000
3) රු. 40,000
4) රු. 42,000
5) රු. 50,000

**18.** LKAS 2 (තොග) ප්‍රමිතයට අදාළව පහත සඳහන් කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වන්නේද?

A. තොග මැනීම සිදුකල යුත්තේ තොගයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් වඩා අඩු අගයටය.
B. ඍජු අමුද්‍රව්‍ය පිරිවැය පරිවර්තන පිරිවැයට අයත් වේ.
C. කර්මාන්ත පරිපාලන පිරිවැය තොග වලට අයත් නොවේ.

1) A පමණි
2) B පමණි
3) A හා C පමණි
4) B හා C පමණි
5) A, B හා C යන සියල්ලම

**19.** ප්‍රතිපාදනයන්, අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතියට (LKAS 37)අනුව නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.

1) ප්‍රතිපාදනයක් යනු කාලය හෝ ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිතතාවයක් සහිත බැරකම් වේ.
2) ප්‍රතිපාදනයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීමක් ලෙස පෙන්නුම් නොකළ යුතුය.
3) අසම්භාව්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වත්කම් ලෙස පෙන්නුම් නොකළ යුතුය.
4) අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම් ලෙස පෙන්නුම් නොකළ යුතුය.
5) ආයතනයෙහි පාලනයෙන් තොරව අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් සිදුවීම හෝ නොවීම මත ඇති විය හැකි වගකීම් අසම්භාව්‍ය වගකීම් වේ.

**20.** ව්‍යාපාරයක් බොල් ණය කපාහැරීම සහ වෙළඳ ණය ගැතියන් මත හානිකරණ අලාභ වෙන්කිරීමට අදාළ සියළු ගැලපිළි බොල්ණය හා වෙළඳ ණය ගැතියන් මත හානිකරණ අලාභ වෙන්කිරීමේ ගිණුමක් තුළ සිදු කරයි. පහත තොරතුරු ඔබට ලබා දී ඇත.

- 2023.03.31 දිනට වෙළඳ ණය ගැතියන් මත හානිකරණ අලාභ වෙන්කිරීම රු. 44,000
- 2024.03.31 දිනට ණයගැතියෝ රු. 921,000 ක් වූ අතර එයින් රු. 21,000 ක ණයගැතියෙක් අයකරගත නොහැකි හෙයින් කපාහැරිය යුතුය
- පසුගිය වසරක කපාහල රු. 27,000 ක බොල්ණය සඳහා 2023/2024 වසරේදී මුදල් ලැබුණි.
- ණයගැති ශේෂයෙන් 10% ක් හානිකරණ අලාභ ලෙස වෙන් කළ යුතුය.

2023/2024 වර්ෂයට බොල් ණය හා වෙලඳ ණය ගැතියන් මත හානිකරණ අලාභ වෙන්කිරීම ලෙස ලාභාලාභ ගිණුමට අයකළ යුතු වටිනාකම කොපමණද?

1) රු. 67,000  2) රු. 40,000  3) රු. 46,000
4) රු. 90,000  5) රු. 92,100

**21.** ගිණුම්කරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ තොරතුරු වල පැවතිය යුතු ගුණාත්මක ලක්ෂණ තුනක් නිවැරදිව දැක්වෙනුයේ,

1) විශ්වාසදායී බව, අදාළ බව, නිරවද්‍ය බව
2) අවබෝධ කරගත හැකි බව, සැසඳිය හැකි බව, සම්පූර්ණත්වය
3) අවබෝධ කරගත හැකි බව, විශ්වාසදායී බව, අදාළ බව
4) අදාළ බව, සැසඳිය හැකි බව, නිරවද්‍යතාවය
5) සම්පූර්ණත්වය, නිරවද්‍යතාවය, විශ්වාසදායී බව

**22.** බ්‍රයන් සමාගමේ 2023 වර්ෂයේ ණයගැනියන්ගෙන් මුදල් ලැබීම නිසා රු. 80,000 කින් කාරක ප්‍රාග්ධනය වෙනස් විය. සියලුම ණයගැතියන්ට ලබාදුන් වට්ටම් අනුපාතය 10% කි. සියලුම ණයගැතියන්ට මෙම ප්‍රතිලාභය ලබාදී ඇත. 2023.12.31 දිනට ණයගැති අගය රු. 150,000 කි. එය වර්ෂයේ ණයට විකුණුම් වලින් 1/4 කි. 2023.01.01 දිනට ණයගැති ශේෂය වන්නේ,

1) රු. 600,000  2) රු. 350,000  3) රු. 900,000
4) රු. 150,000  5) රු. 275,000

**23.** දේපල පිරියත හා උපකරණ ක්ෂය වීම වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනීමට පාදක වන ගිණුම්කරණ සංකල්පය,

1) ඒකක  2) අඛණ්ඩ පැවැත්ම  3) ආරක්ෂණ
4) උපලබ්ධි  5) උපචිත

**24.** පහත දැක්වෙන ගනුදෙනු අතරින් දැනට පවතින ජංගම අනුපාතය ඉහළ යාමට හේතුවන ගනුදෙනුව / ගනුදෙනු කාණ්ඩය වන්නේ,

A. ණයහිමියකු පියවීම
B. ලාභ ඇතිව අත්පිට විකිණීම
C. ණයට තොග මිලට ගැනීම

1) A පමණි  2) B පමණි  3) C පමණි
4) A හා B පමණි  5) A, B හා C යන සියල්ලම

**25.** සීමිත සෙලින්කෝ සමාගමේ 2023 නොවැම්බර් මස වැටුප් ලේඛනයෙන් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| මූලික වැටුප | 60,000 | සේ.අ.අ. - සේවකයා (EPF) | 8% |
| ණය වාරික | 8,400 | සේ.අ.අ. - සේව්‍ය (EPF) | 12% |
| උත්සව අත්තිකාරම් | 3,500 | සේ.භා.අ. (ETF) | 3% |
| අතිකාල දීමනා | 4,200 | දළ වැටුප | 69,200 |
| ප්‍රවාහන දීමනා | 5,000 | | |

සේ.අ.අ. ගණනය කරනු ලබන්නේ අතිකාල හැර දළ වැටුපටයි. අදාල මාසය සඳහා ශුද්ධ වැටුප හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සටහන් කළ යුතු සේ.අ.අ. වගකීම පිළිවෙලින්,(සේවක අර්ථ සාධක අරමුදලට කල යුතු ගෙවීම් සියල්ල ප්‍රවර්ථන මාසයට පසු මාසයේදි සිදුකරනු ලබයි)

1) රු. 52,100 / රු. 13,000  2) රු. 61,300 / රු. 14,840  3) රු. 52,100 / රු. 13,380

4) රු. 61,300 / රු. 12,000 5) රු. 81,000 / රු. 13,840

**26.** 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමක ආදායම් ප්‍රකාශනයෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | |
|---|---|
| විකුණුම් | රු. 4,000,000 |
| ආදායම් බදු වියදම | රු. 80,000 |
| පොලී වියදම් | රු. 60,000 |
| කාලච්ඡේදයේ ලාභය | රු. 400,000 |

2024.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සහ පොලී ආවරණ අනුපාතය කොපමණ ද?

| | **ශුද්ධලාභ අනුපාතය (%)** | **පොලී ආවරණ අනුපාතය (වාර)** |
|---|---|---|
| 1) | 10 | 5 |
| 2) | 10 | 9 |
| 3) | 10 | 8 |
| 4) | 5 | 9 |
| 5) | 7.5 | 8 |

**27.** ආයතනයක් භාවිතා කරනු ලබන අමුද්‍රව්‍යකට අදාළ ව පහත තොරතුරු දී ඇත.

| | **උපරිම** | **අවම** |
|---|---|---|
| පරිභෝජනය (ඒකක ) | 600 | 200 |
| පොරොත්තු කාලය (සති ) | 6 | 3 |

මෙම අමුද්‍රව්‍යයේ අවම තොග මට්ටම කොපමණ ද?

1) ඒකක 600
2) ඒකක 1,800
3) ඒකක 3,600
4) ඒකක 4,400
5) ඒකක 3,000

**28.** අයිතමයක නිෂ්පාදන ප්‍රමාණය වැඩි වන විට පහත කුමන ප්‍රකාශනය නිවැරදි ද?

1) ඒකකයක විචල්‍ය පිරිවැය අඩු වේ
2) ඒකකයක ස්ථාවර පිරිවැය අඩු වේ
3) මුළු පිරිවැය අඩු වේ
4) ඒකකයක ස්ථාවර පිරිවැය සහ ඒකකයක විචල්‍ය පිරිවැය වෙනස් නොවේ
5) ඒකකයක විචල්‍ය පිරිවැය වෙනස් නොවී පවතින අතර ඒකකයක ස්ථාවර පිරිවැය වැඩි වේ

**29.** පිරිවැය, පරිමා හා ලාභ (CVP) විශ්ලේෂණයේදී, දායකය යනු,

1) විකුණුම් ආදායම සහ ලාභය අතර වෙනස
2) විකුණුම් ආදායම සහ මුළු පිරිවැය අතර වෙනස
3) විකුණුම් ආදායම සහ ස්ථාවර පිරිවැය අතර වෙනස
4) විකුණුම් ආදායම සහ මුළු විචල්‍ය පිරිවැය අතර වෙනස
5) විකුණුම් ආදායම සහ විකුණුම් පිරිවැය අතර වෙනස

**30.** පිරිවැය වර්ගීකරණයට අදාළ ව පහත කුමන ප්‍රකාශය නිවැර දි වේ ද?

1) නිෂ්පාදිත පිරිවැය සමන්විත වන්නේ සෘජු පිරිවැයෙන් පමණි
2) සියලු සෘජු පිරිවැය, විචල්‍ය පිරිවැය වේ
3) යන්ත්‍ර ක්ෂය පාලනය කළ හැකි පිරිවැයක් ලෙස සලකනු ලබයි
4) පිරිවැය හැසිරීම මත ප්‍රධාන වශයෙන් විචල්‍ය සහ ස්ථාවර ලෙස වර්ග කරනු ලැබේ
5) තොග මැනීම සඳහා පිරිවැය, අදාළ සහ අදාළ නොවන ලෙස වර්ග කරනු ලැබේ

**31.** 2023.03.31 දිනට ආයතනයක මුළු වත්කම් හා මුළු වගකීම් පිළිවෙලින් රු. 1,000,000 ක් හා රු. 300,000 ක් විය. මෙම සංඛ්‍යා වලට එළඹීමේදී පහත වැරදීම් සිදු වී ඇත.

- 2023 අප්‍රේල් මාසයේදී භාණ්ඩ විකිණීම සඳහා ගනුදෙනුකරුවෙකුගෙන් ලබාගත් රු. 20,000 ක අත්තිකාරම්, අයභාරය ලෙස හඳුනාගෙන තිබීම.
- 2023 මාර්තු මාසය සඳහා නොගෙවූ 5,000 ක විදුලි බිල වාර්තාවලින් මග හැරීම.
- රු. 10,000 ක විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජ'නලයේ දෙවතාවක් වාර්තා කර තිබීම.

ඉහත වැරදි නිවැරදි කිරීමෙන් පසුව මුළු වත්කම් ප්‍රමාණය හා මුළු වගකීම් ප්‍රමාණය ගණනය කරන්න.

a) මුළු වත්කම් ..........................................................................
b) මුළු වගකීම් ..........................................................................

**32.** සුළු මුදල් ප්‍රතිපූර්ණය කරන දිනයේ දී සුළු මුදල් භාරකරු ළඟ රු. 1,200 ක් ඉතිරිව තිබුණි. අයිතිකරු සිය පෞද්ගලික ප්‍රයෝජනයට ගත් රු. 400 ඇතුළත් ව රු. 6,800 ක් ගෙවීම් කර තිබුණි.

1. සුළු මුදල් අග්‍රිමය කොපමණ ද? ..........................................................................
2. එම දිනට ප්‍රතිපූර්ණය කළ යුතු මුදල කොපමණ ද? ..........................................................................

**33.** බේකරි අයිතම කිහිපයක් නිපදවන ආයතනයක පහත පිරිවැය මූලිකාංග සඳහා එක් උදාහරණය බැගින් දක්වන්න. (බේකරි අයිතම පිරිවැය ඒකකය ලෙස සලකන්න.)

සෘජු අමුද්‍රව්‍ය ..........................................................................
වක්‍ර ශ්‍රමය ..........................................................................
වක්‍ර වියදම් ..........................................................................
වක්‍ර අමුද්‍රව්‍ය ..........................................................................

**34.** මූලාශ්‍ර ලේඛන භාවිතයේ ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................
2. ..........................................................................................................................................

**35.** විස්තීරන ආදායම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය අතර වෙනස පහත කරුණු මත වෙන්කොට දක්වන්න

| | විස්තීර්න ආදායම් ප්‍රකාශනය | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය |
|---|---|---|
| පදනම | ................................................ | ................................................ |
| සපයන තොරතුරු වල ස්වභාවය | ................................................ | ................................................ |

**36.** පහත කරුණු හේතුවෙන් බැංකු ප්‍රකාශනයේ ශේෂය, මුදල් පොතේ ශේෂයට සාපේක්ෂව වැඩි වේ ද, අඩු වේ ද යන්න දක්වන්න.

| | වැඩි වේ/ අඩු වේ. |
|---|---|
| A. නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක් | ....................................... |
| B. තැම්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක් | ....................................... |
| C. මුදල් පොතේ සටහන් නොවූ ණයගැති සෘජු ප්‍රේෂණ | ....................................... |
| D. මුදල් පොතේ සටහන් නොවූ බැංකු ගාස්තු | ....................................... |

**37.** සීමිත නිලූ පොදු සමාගමේ 2023.04.01 දිනට පහත ශේෂ පැවතුණි.

| | රු. '000 |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 100,000) | 2,000 |
| රඳවාගත් ඉපැයුම් | 800 |

2023.09.30 දින සමාගම් කොටසක් රු. 20 ක ප්‍රතිෂ්ඨාවකට රු. 400,000 ක රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. 2023.12.31 දිනට පැවනි සෑම කොටස් 12 කටම 1 බැගින් කොටසක් රු. 10 ක ප්‍රතිෂ්ඨාවකට හිමිකම් නිකුතුවක් එදින සිදු කරන ලදී. දැනට සිටින කොටස් හිමියන් විසින් සියලුම හිමිකම් කොටස් සඳහා දායක වන ලදී. 2024.03.31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා ලාභය රු. 300,000 ක් විය. පහත දෑ සඳහන් කරන්න.

(අ) ඉහත කොටස් නිකුත් කිරීම් නිසා සිදුවූ මුදල් ශේෂ යේ වැඩි වීම. රු . ............................................

(ආ) 2024.03.31 දිනට හිමිකම රු . ............................................

**38.** අදාළ තීරුවේ X ලකුණ යොදමින් පහත ප්‍රකාශ සත්‍ය හෝ අසත්‍ය බව දක්වන්න.

| ප්‍රකාශය | සත්‍ය | අසත්‍ය |
|---|---|---|
| A. නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී සියලු පොදු කාර්යය පිරිවැය සැලකිල්ලට ගත යුතුය. | ............................................ | ............................................ |
| B. අඩමාණ ණය වෙන්කිරීම ආරක්ෂණ සංකල්පයට අනුකූල වේ. | ............................................ | ............................................ |
| C. අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය. | ............................................ | ............................................ |
| D. විකුණුම් ආදායමෙන් විචල්‍ය පිරිවැය අඩුකල විට සහභාගය ලැබේ. | ............................................ | ............................................ |

**39.** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව "මූල්‍ය ක්‍රියාකාරකම්" නිර්වචනය කරන්න.

...........................................................................................................................................................

**40.** QB ක්‍රීඩා සමාජයේ 2023.04.01 දිනට සාමාජිකයන් 100 ක් සිටිය අතර එක් අයෙකුගේ මාසික සාමාජික මුදල රු. 100 ක් විය. 2023.04.01 දිනට හිඟහිටි සාමාජික මුදල රු. 6,000 ක් වූ අතර එම සාමාජිකයන්ගේ සාමාජිකත්වය 2023.04.01 දින අහෝසි කරන ලදී. ඔවුන් පසුගිය වර්ෂය සඳහාම සාමාජික මුදල් ගෙවා නොතිබුණි. 2023.10.01 දින නව සාමාජිකයන් 10 දෙනෙකු බඳවා ගන්නා ලද අතර 2024.03.31 දිනට හිඟහිටි සාමාජික මුදල රු. 10,000 ක් විය.

(අ) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම කීයද?

...........................................................................................................................................

(ආ) 2024.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල කීයද?

...........................................................................................................................................

**41.** ව්‍යාපාරයක රු. 40,000 ක තොගයක් ගංවතුරින් විනාශ විය. එම තොගය නැවත රු. 8,000 ක වියදමක් දරා රු. 38,000 කට විකිණිය හැකි බව ඇස්තමේන්තු කරන ලද අතර විකුණුම් කොමිස් ප්‍රමාණය විකුණුම් මිලෙන් 10% ක් නම් තොගයේ ශුද්ධ උපලබ්ධි අගය කොපමණ ද?

...........................................................................................................................................

**42.** සාමාන්‍ය විකුණුම් වලට අමතරව විකිණීමේ හෝ ආපසු එවීමේ පදනම මත යවන ලද රු. 150,000 ක් පිරිවැය වූ හා රු. 180,000 ක් විකුණුම් මිල වූ භාණ්ඩ තොගයක් ණයට විකුණුම් ලෙස ගිණුම්ගත කර ඇත. වර්ෂයේ ලාභය රු. 100,000 ක් වූ අතර එය ගණනය කිරීමෙන් අනතුරුව ඉහත 1/5 ක් ගිණුම් වර්ෂය අවසාන වන විට නොවිකිණී තිබූ බව හා ඒවා ආපසු එවීමේ කාලය ඉකුත් වී නොතිබූ බව හෙළිදරව් වී ඇත. වර්ෂයේ නිවැරදි ලාභය කොපමණ ද?

..........................................................................................................................................................

**43.** LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති,ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි ) ප්‍රමිතියට අනුව සමාගමකට ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්කළ හැකි අවස්ථා දෙක සඳහන් කරන්න.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

**44.** නිෂ්පාදන සමාගමක පහත එක් එක් අවස්ථාවලට වඩාත් අදාළ වන ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| අවස්ථා | ගිණුම්කරණ සංකල්පය |
|---|---|
| A. වසර අග අමුද්‍රව්‍ය තොගය එහි පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මිනුම් කිරීම | .................................................... |
| B. සෑම ගිණුම් කාලච්ඡේදයක් සඳහ ම නිශ්පාදන ගිණුමක් පිළියෙල කිරීම | .................................................... |
| C. භාණ්ඩ භාරදීමට පෙර ගනුදෙනුකරුවකුගෙන් ලද අත්තිකාරමක් වගකීමක් ලෙස හඳුනා ගැනීම | .................................................... |
| D. යන්ත්‍රයක් මත වෙන් කරන ලද ක්ෂය, නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයක් ලෙස නිෂ්පාදන ගිණුමෙහි හඳුනා ගැනීම | .................................................... |

**45.** සමාගමක් 2023.04.01 දින කල්බද්දක් යටතේ රු. 4,000,000 ක් සාධාරණ අගය වූ මෝටර් රථයක් අත්පත් කර ගත් අතර මූලික තැන්පතුව ලෙස රු. 1,600,000 ක් ගෙවන ලදී. වාර්ෂික කල්බදු වාරිකය රු. 930,000 ක් වූ අතර කල්බදු කාල සීමාව වසර 4 කි. මෙම මෝටර් රථයේ ඵලදායි ජීව කාලය වසර 5 ක් වන අතර කල්බදු කාල සීමාව අවසානයේදී මෝටර් රථයේ අයිතිය සමාගමට හිමි නොවේ. පළමු කල්බදු වාරිකය තුළ ඇතුළත් පොළිය රු. 480,000 ක් වූ අතර දෙවන කල්බදු වාරිකය තුළ ඇතුළත් පොළිය රු. 390,000 ක් විය.

(අ). 2024.03.31 න් අවසන් වර්ෂය සඳහා මෙම මෝටර් රථයේ ක්ෂය වියදම කීයද?

..........................................................................................................................................................

(ආ). මෙම ගනුදෙනුවට අදාළව 2024.03.31 දිනට සමාගමේ ජංගම නොවන වගකීම් කීයද?

..........................................................................................................................................................

**46.** ව්‍යාපාරයක කලමණාකරණ ගිණුම්කරණයේ කාර්යභාරය අදාලව පහත ප්‍රකාශ සත්‍ය අසත්‍ය බව දක්වන්න.

A. පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශ කළමනාකරණ ගිණුම්කරණය මඟින් සපයයි. (.....................)
B. එය ව්‍යාපාරයක අතීත තොරතුරු පමණක් සපයයි (.....................)
C. එයින් මූල්‍ය ගිණුම්කරණයට තොරතුරු සපයයි (.....................)
D. එය ව්‍යාපාරයේ අතීත හා අනාගත තොරතුරු සපයයි (.....................)

**47.** සමාගමක් සතුව නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. සේවා දෙපාර්තමේන්තුවේ අයවැයගත පොදු කාර්ය පිරිවැය රු. 100,000 ක් වන අතර එය නිෂ්පාදන දෙපාර්තමේන්තු

වැඩ කළ යන්ත්‍ර පැය ගණන මත පදනම්ව නැවත බෙදාහරිනු ලැබේ. පහත අතිරේක අයවැයගත තොරතුරු ද දී ඇත.

| | **නිෂ්පාදන දෙපාර්තමේන්තු I** | **නිෂ්පාදන දෙපාර්තමේන්තු II** |
|---|---|---|
| යන්ත්‍ර පැය | 7,000 | 3,000 |
| ඒකකයක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 120 | රු. 140 |
| ඒකකයක සැකසුම් කාලය | යන්ත්‍ර පැය 3 | යන්ත්‍ර පැය 2 |

නිෂ්පාදන දෙපාර්තමේන්තු I සඳහා පහත දෑ දක්වන්න.

(අ) නැවත විභාජනය කරන ලද සේවා දෙපාර්තමේන්තු පොදු කාර්ය පිරිවැය :රු................................................

(ආ) යන්ත්‍ර පැයකට පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය : රු................................................

නිෂ්පාදන දෙපාර්තමේන්තු II සඳහා පහත දෑ දක්වන්න.

(ඉ) මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය : රු. ................................................

**48.** 2023 ජූනි මාසය සඳහා සමාගමක වැටුප් සාරාංශය පහත දී ඇත.

| **විස්තරය** | **රු.** |
|---|---|
| මූලික වැටුප | 100,000 |
| දීමනා | 25,000 |
| සේවක අර්ථසාධක මුදල් අඩුකිරීම් | 8,000 |
| උත්සව අත්තිකාරම් අඩුකිරීම | 7,000 |
| ශුද්ධ වැටුප | 110,000 |
| සේව්‍ය අර්ථසාධක අරමුදල් දායකය | 12,000 |

ජූනි මාසය සඳහා සමාගමේ සේවකයින්ට අදාළ මුලු වියදම කොපමණද? ................................................

**49.** පහත එකිනෙක අවස්ථා නිසා ආයෝජන ව්‍යාපෘතියක පිළිගෙවුම් කාලය වැඩි වේ ද, අඩු වේ ද, වෙනස් නොවේ ද යන්න දක්වන්න.

| | **වැඩි වේ/ අඩු වේ /වෙනස් නොවේ** |
|---|---|
| A. ආරම්භක ආයෝජනය ඉහළ යාම | ............................................... |
| B. වාර්ෂික මුදල් ගලා ඒම් පහළ යාම | ............................................... |
| C. වාර්ෂික මුදල් ගලා යාම් පහළ යාම | ............................................... |
| D. වට්ටම් අනුපාතය ඉහළ යාම | ............................................... |

**50.** සමාගමක් විසින් රු. 2,400,000 කට යන්ත්‍රයක් මිලදී ගැනීමට සලකා බලමින් සිටී. එහි ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙලින් වසර 5 ක් සහ රු. 600,000 ක් වේ. ක්ෂය වෙන්කිරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කරනු ලබයි. මෙම යන්ත්‍රයන් රු. 600,000 ක ශුද්ධ මුදල් ප්‍රවාහයක් සෑම වර්ෂයක දී අපේක්ෂා කෙරේ.
පහත දෑ ගණනනය කරන්න.

(අ). පිළිගෙවුම් කාලය (වසර)..........................................................

(ආ).ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය - සාමාන්‍ය ආයෝජනය මත පදනම් ව (%)......................................

සියලු ම හිමිකම් ඇවිරිණි/அனைத்து உரிமைகளும்/All Right Reserved

WWW.QUESTIONBANK.LK

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

**ගිණුම්කරණය** | 33 S II | **පැය තුනයි**

අමතර කියවීම් කාලය - මිනිත්තු (10) යි
Additional Reading Time - 10 minutes

විභාග අංකය :.............................................................

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිලිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදා ගන්න

වැඩසටහන් සම්පාදනය කල නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

**උපදෙස්**

* **පලමුවන** හා **දෙවන** ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පමණක් පිලිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිලිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාල පෙරවැඩ, පිලිතුරු පත්‍රය සමග අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

**01.** ABC සීමිත පොදු සමාගමේ 2024.03.31 දිනට ශේෂ පිරික්සුම පහත ලබා දී ඇත.

ශේෂ පිරික්සුම

| | (රු.000) | (රු.000) |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (110,000) | | 4,500 |
| ආරම්භක තොග - 2023.04.01 | 230 | |
| ගැණුම් හා විකුණුම් | 14,200 | 20,300 |
| ධනු සමාගමේ වරණීය කොටස් වල ආයෝජනය | 400 | |
| වැටුප් හා වේතන | 2,200 | |
| EPF වියදම | 150 | |
| ETF වියදම | 30 | |
| ණයගැති හා ණයහිමි | 5,200 | 3,400 |
| අනෙකුත් ආයතනික හා පරිපාලන වියදම් | 760 | |
| විකුණුම් හා බෙදාහැරීම් වියදම් | 800 | |
| බොල් හා අඩමාණ ණය | 120 | |
| 2023/04/01 බොල්ණය හා වෙලඳ ණය ගැතියන් මත හානිකරණ අලාභ වෙන් කිරීම් | | 780 |
| 20% ස්ථාවර තැන්පතු | 4,000 | |
| පොලී ආදායම් | | 500 |
| ගෙවූ ලාභාංශ - සා.කො. | 120 | |
| දේපල පිරියත උපකරණ (ශුද්ධ අගය) | 3,300 | |
| ආදායම් බදු - 2022/23 | 180 | |
| - 2023/24 | 160 | |
| ආදායම් බදු වෙන් කිරීම 2022- 23 | | 520 |
| රඳවාගත් ලාභ | | 4,020 |
| වත්කම් විකුණුම් ලාභ | | 850 |
| තාවකාලික වත්කම් ගිණුම | 300 | |
| බැංකු හා මුදල් | 2,720 | |

| | | |
|---|---|---|
| | 34,870 | 34,870 |

අමතර තොරතුරු

I. 2024/03/31 පිරිවැය 430,000 වු අවසන් තොගයෙන් කිසියම් වටිනාකමක් සහිත තොග ප්‍රමාණයක් 2024/03/31 දින සවස සොරකම් කර ඇත. මෙම තොග සොරකම නිසා ශුද්ධ ලාභය රු. 44,500 කින් පමණ පහත වැටන බව කලමණකාරීත්වය පවසා සිටියි.

II. ආයතනය අඩමාණ ණය වෙන් කිරීම ණය එකතු කිරීමට ගත වන කාලය මත පදනම්ව සිදු කරන අතර ණය එකතු කිරිමේ කාලය දින 30 ට වැඩි නම් දල ණයගැතියන්ගෙන් 10% ක් ද දින 30 අඩු නම් දල ණයගැතියන්ගෙන් 4.75 % ද වේ. (වර්ෂයකට දින 360 ක් සේ සලකන්න.)

III. 2023/12/01 දින ආයතනයේ සියලුම සේවකයන්ට උත්සව අත්තිකාරම් වශයෙන් රු. 1,200,000 ලබා දුන් අතර එය 2024/01/01 සිට මාස තුනකින් අදාල සේවකයන්ගේ වැටුපෙන් අඩුකර ගනු ලැබේ. මෙම මුදල සේවකයන්ගේ වැටුපෙන් නිවැරදිව අඩුකර තිබු නමුත් සේව්‍ය හා සේවක EPF/ETF ගණනය කර තිබෙනුයේ දල වැටුපෙන් මෙම අත්තිකාරම අඩු කල අගයටය. සේව්‍යයා EPF සඳහා 15% ක් ද ETF සඳහා 3% ක් ද හා සේවකයා EPF සඳහා 10% ක් ද දල වැටුප මත දායක වේ.

IV. 2023/09/30 දින එදිනට වර්ෂ තුනකට පමණ පෙර මිල දි ගත් එදිනට ශුද්ධ අගය රු. 700,000 ක් වු මෝටර් රථයක් රු. 850,000 කට විකුණා ඇත. මෙම මෝටර් රථය සඳහා සුන්බුන් අගයක් නොතිබු අතර 10% ක්ෂය අනුපාතයට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරන ලදි. මෙම ලැබුණු මුදල් ලාභයක් සේ සැලකීම හැර වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

V. ආයතනයේ 2023/04/01 දිනට දේපල හා පිරියත පහත පරිදි වේ.

| අයිතමය | පිරිවැය | ධාරණ අගය | ක්ෂය අනුපාතය |
|---|---|---|---|
| ඉඩම් | 1,000,000 | | - |
| ගො/නැ | 400,000 | 400,000 | 10% |
| මෝටර් රථ | 1,200,000 | 500,000 | 10% |
| ලී බඩු | 700,000 | 200,000 | 15% |

සියලුම දේපල සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

2023/09/30 දින ආයතනයේ පරිසර දූෂණය වැලැක්වීමේ වැඩපිළිවෙල යටතේ කර්මාන්ත ශාලාවේ පැවති ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු ඉවත් කර රු. 300,000 වියදමක් දරමින් උළු සෙවිලි කර ඇත. ආයතනයේ ගණකාධිකාරීවරයාට මෙම වියදම සම්බන්ධයෙන් අවසන් තීරණයකට පැමිණීමට නොහැකි වීම නිසා එය තාවකාලික වත්කම් ගිණුමකට හර කරන ලදි. ගලවන ලද ඇස්බැස්ටෝස් තහඩු විනාශ කර දමන ලදි.

VI. මෙම ආයතනයේ ආදායම ප්‍රධාන වශයෙන් සාමාන්‍ය විකුණුම් ආදායම සහ පොලී ආදායම යන දෙයාකාරයකින් සමන්විත වේ. පොලී ආදායම ඉපැයීම සඳහා කිසිම පිරිවැයක් නොදරන අතර එය වෙනත් ආදායම් යටතේ දක්වනු ලැබේ. නමුදු මෙම ආදායම් මාර්ග සඳහා වෙන වෙනම බදු අනුපාත රජය විසින් හඳුන්වා දී ඇත.

සාමාන්‍ය විකුණුම් ආදායම / ලාභය මත 20%
පොලී ආදායම මත 30%

VII. ආයතනයේ සේවකයන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා විදේශ පුහුණුකරුවෙක් ගෙන්වා, රු. 300,000 වියදමක් දරමින් පුහුණු වැඩසටහනක් පැවැත්වුහ. මේ තුලින් සේවකයන්ගේ කාර්යක්ෂමතාව මෙන්ම ඵලදායිතාවය ද ඉහළ යන ලදි. ගෙවු මුදල පරිපාලන වියදම් තුල අඩංගු වේ.

VIII. ආයතනය විකුණුම් මත 1.9 % ක් වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන කිරිම 2023/24 වර්ෂයේ දී ආරම්භ කරන ලදි.

IX. නව ව්‍යාපෘතියක් සඳහා මුල්‍ය සම්පත් සොයා ගැනීමට පැවති සාමාන්‍ය කොටස් 10 කට 1 ක් වන සේ කොටසක් රු. 10 බැගින් හිමිකම් නිකුතුවක් සිදු කරන ලදී. මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් සියලුම සටහන් නිවරදිව තබා ඇත.

X. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත තීරණ ගන්නා ලදි.

- සාමාන්‍ය කොටස් හිමියන්ට කොටසකට රු. 10 ක අවසන් ලාභාංශයක් ලබා දීමට.
- 100,000 පොදු සංචිතයට මාරු කිරීම.

**අවශ්‍ය වන්නේ,**

LKAS 01 ප්‍රමිතයට අනුව අනුව ප්‍රසිද්ධ කිරිම සඳහා සී/ස ධනුෂ්ක පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන,( සටහන් ද ඇතුලුව)

1. 2024.03.31 දිනෙන් අවසන් වර් ෂය සඳහා ලාභ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය
2. 2024.03.31 දිනෙන් අවසන් වර් ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය
3. 2024.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

**02. (අ)** සිමිත ලෙදර් ඩිසයින් සමාගම බෑග් නිපදවා අලෙවිකරණ අතර එහි සැකසුම් නිමැවුම් යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් ද ගබඩා අංශයක් ද පවතී. මෙම සමාගම 2022.04.30 මාසය සඳහා බෑග් 1000 ක් නිෂ්පාදනය කිරිම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

සීමිත ලෙදර් ඩිසයින් සමාගමේ තොග පිළිබද තොරතුරු පහත පරිදි වේ.

| දිනය | විස්තරය | ප්‍රමාණය (ඒකක) | ඒකක මිල (රු.) |
|---|---|---|---|
| 04/01 | ශේෂය | 1,000 | 100 |
| 04/08 | ගැණුම් | 2,000 | 120 |
| 04/15 | නිකුත් කිරීම් | 1,500 | |
| 04/17 | ගැණුම් | 2,000 | 140 |
| 04/20 | ආපසු යැවුම් | 500 | (4/08 මිල දී ගත්) |
| 04/20 | නිකුත් කිරීම් | 1,500 | |

තොග නිකුත් කිරිම මිල කිරීම සඳහා FIFO ක්‍රමය භාවිතා කරයි. නිකුත් කළ අමුද්‍රව්‍ය සියල්ල පරිභෝජනය කර ඇත.
සේවක වැටුප් පිළිබඳ තොරතුරු පහත පරිදිය.

| | මුලික වැටුප | අතිකාල | EPF සේවක දායකය | සුභසාධක වාරික අඩු කිරිම | EPF සේව්‍ය | ETF සේව්‍ය |
|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන සේවක | 50,000 | 10,000 | 5,000 | 500 | 7,500 | 1,500 |
| නිෂ්පාදන සුපරීක්ෂක | 50,000 | 10,000 | 3,000 | 500 | 7,500 | 1,500 |
| නිෂ්පාදක කලමනාකරණ සේවක | 40,000 | 5,800 | 4,000 | 500 | 6,000 | 1,200 |

නිෂ්පාදන පොදු කාර්යය තොරතුරු පහත පරිදිය.

- වක්‍ර වැටුප් සැකසුම් නිමැවුම් දෙපාර්තමේන්තු අතර සමානව විභාජනය කරයි.
